**ගාල්ල මහා නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවීමට තිබූ රු.1,453,130 ක් හා ආයුර්වේද බෙහෙත් ශාලාවේ වර්ෂය අවසානයට රු.295,919 ක් වූ ඉතිරි තොගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව අපහරණය කරන ලද රු.312,621 ක් වූ ස්ථාවර වත්කම්වල පිරිවැය, ස්ථාවර වත්කම් අගයෙන් ඉවත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ විවිධ ආයතන වලින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වත්කම් වර්ග 04 ක් හා රු.164,450 ක් වූ ඡායාපිටපත් යන්ත්‍රයක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.101,792,235 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගත නොවූ කර්මාන්ත 33 ක් වෙනුවෙන් රු.20,797,463 ක් කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය හා ණයහිමියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ඇත්තිලිගොඩ හිඹුටුවවත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබිය දී, අවලංගු කරන ලද ව්‍යාපෘතියක් ලෙස ණයහිමියන්ගෙන් රු.287,842 ක් අඩුකර තිබුණි.

(උ) ගාල්ල පහළ ඩික්සන් පාර කොටසක පැති කාණු ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව ණයහිමි ප්‍රතිපාදන සඳහා රු.1,026,460 ක් වැඩියෙන් වෙන්කර තිබුණි.

(ඌ) ඉදිකිරීමේ කර්මාන්තයක් සඳහා රු.721,754 ක් වූ මුළු මුදල ගෙවා තිබිය දී ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණි.

(එ) ව්‍යාපාර බදු ආදායම රු.2,886,100 ක් සහ විනෝද බදු ආදායම රු.381,409 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඒ) ආයුර්වේද සංස්ථාවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.3,085,505 ක් වූ ඖෂධ තොගය ගිණුම් ගතකර නොතිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයන්හි රු.26,534,772 ක් වූ කර්මාන්ත ණයහිමි අධි වෙන්කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබීම හේතුවෙන් ණයහිමියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දැක්වුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.279,381,568 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර අසමානතාවල එකතුව රු.10,120,162 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

**--------------------**

2003 වර්ෂයේ සිට පැවත එන රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

**(අ) ලැබිය යුතු ගිණුම්**

-------------------

වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.4,957,752 ක් වූ ගිණුම් ශේෂ 07 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.176,625,737 ක් වූ විවිධ ණයහිමි ශේෂය සහ රු.115,197,426 ක ගබඩා ණයහිමි ශේෂය පිළිබඳ කාල විශ්ලේෂණයක් හා උපලේඛන පිළියෙල කර නොතිබූ අතර, එම ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**---------------------------------------------------**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

--------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.188,001,769 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **(අ) 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත** | | |
| 247(ඇ) වගන්තිය | - | මහා නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු එකතු කිරීමක් කර නොතිබූ අතර, එවැනි ඉඩම් සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 102 සිට 110 දක්වා | - | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබූ අතර, අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 755(2) | 45,107,815 | ගබඩාවේ භෞතික තොගය, බඩු ලේඛනය හෝ ලෙජරය සමඟ සසඳා නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන තුළ වූ තොග ශේෂය සම්බන්ධයෙන් තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | 13,085,269 | සභාවට අයත් වාහන 133 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.13,085,269 ක ඉන්ධන වියදමක් දරා තිබූ නමුත්, දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2014 පෙබරවාර් 24 දිනැති අංක CSS/7/1/1/1 දරන ප්‍රධාන ලේකම්ගේ (මුදල්) චක්‍රලේඛය | - | මුදල් හා ගබඩා භාරව වර්තමානයේ සභාවේ සේවය කරන කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**1.3.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.85,306,803 ක් වූ තොග ශේෂයෙන් රු.45,615,140 ක්, මහා නගර සභා ආඥා පනතේ 266(අ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කපාහැර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.198,808,270 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.128,351,803 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 02 කට අදාළ රු.278,053 ක් වූ හර කිරීම් ද, රු.1,316,335 ක බැර කිරීම් ද නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණ අතර, ඇතැම් අයිතමයන් නිරවුල් නොකර වසර 15 කටත් අධික කාලයක් තිස්සේ පැවතුණි.

(ආ) සභාවේ ජංගම ගිණුම් 04 ක පැවති රු.27,778,529 ක සාමාන්‍ය මාසික ශේෂය මහා නගර සභා ආඥා පනතේ 187 වගන්තිය ප්‍රකාරව සුරැකුම්පත් වල ආයෝජනය නොකිරීම නිසා සභාවට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන සැලසුම් චක්‍රලේඛය ප්‍රකාරව සභාව නමින් ආරම්භ කළ ගිණුමට බැර වියයුතු, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලයට අදාළ රු.768,963 ක් ඉතුරුම් ගිණුමට මාරු කිරීමෙන් තොරව පොදු ගිණුම තුළ රඳවා තබා ගෙන තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 83,010,000 | 90,149,355 | 100,394,779 | 137,776,385 | 75,252,000 | 88,075,816 | 82,601,810 | 138,093,351 |
| කුලී | 80,292,000 | 33,403,743 | 43,777,996 | 28,588,585 | 122,465,000 | 26,779,527 | 65,895,857 | 20,534,897 |
| බලපත්‍ර | 33,004,000 | 14,663,088 | 40,214,605 | 11,537,062 | 24,614,500 | 10,270,361 | 25,003,030 | 6,047,154 |
| ගාස්තු වෙනත් ආදායම් | 540,675,000 | 119,737,551 | 343,683,541 | 296,555,871 | 527,507,000 | 118,811,159 | 394,058,863 | 200,746,239 |
| එකතුව | 736,981,000 | 257,953,737 | 528,070,921 | 474,457,903 | 749,838,500 | 243,936,863 | 567,559,560 | 365,421,641 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.736,981,000 ක් වූ අතර, බිල්කළ ආදායම රු.257,953,737 ක් විය. රු.365,421,641 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුදල රු.623,375,378 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.528,070,921 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.474,457,903 ක් වී තිබුණි.

### 2.3.3 වරිපනම් හා බදු

(i) සමාලෝචිත වර්ෂය තුළ අය කළයුතු වරිපනම් බදු ආදායමින් අයකිරීම් සියයට 44 ක් වූ අතර, හිඟ ආදායම් අයකර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ 252(අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2017 දෙවන කාර්තුව දක්වා වූ හිඟ වරිපනම් බදු රු.195,079,776 ක් අය කිරීම සඳහා වූ ලැයිස්තු දේපල තහනම් කිරීමේ නිලධාරීන් 16 දෙනෙකුට භාර දී තිබුණු අතර, එයින් රු.19,186,570 ක බදු මුදල් අය කරගෙන තිබුණි. දේපල තහනම් කිරීමේ නිලධාරීන්ට ඊට අදාළ කොමිස් මුදල් ලෙස රු.1,748,241 ක් ගෙවා තිබුණු අතර, අංක 02 කොට්ඨාශයේ හිඟ වරිපනම් වලින් අය කිරීම් සියයට 1.5 ක් විය.

**2.3.4 කුලී**

**-----**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලී ශේෂය රු.28,588,585 ක් වූයෙන් ආරම්භක ශේෂයට සාපේක්ෂව රු.8,053,688 කින් වර්ධනය වී තිබුණි. හිඟ බදු කුලී අයකිරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 44 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟ බලපත්‍ර ගාස්තු ශේෂය වර්ෂය අවසානය වනවිට රු.5,489,908 කින් වර්ධනය වී තිබුණි. හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.6 වෙනත් ආදායම්**

**-----------------**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමට, සාපේක්ෂව ඒ ඒ වර්ෂයන්ට අදාළ බිල්කළ ආදායම සියයට 22 ක් තරම් අඩු අගයක් විය. වර්ෂයේ ආරම්භයට වූ වෙනත් ආදායම්හි රු.200,746,239 ක් වූ හිඟ ශේෂය වර්ෂය අවසාන වනවිට රු.296,555,871 ක් දක්වා රු.95,809,632 කින් වර්ධනය වී තිබුණි.

**2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

ප්‍රමාණවත් ලේඛන නඩත්තු නොකිරීම නිසා පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යයසාධනය**

**------------------**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සේවා පරීක්ෂක නිලධාරීන් විසින් තමාට අදාළ කලාප තුළ ක්‍රියාත්මක කළයුතු වැඩසටහන් ක්‍රියාවට නංවා නොතිබුණු අතර, ඒ පිළිබඳව ඉහල කළමනාකරණයේ අවධානයට ලක් වී නොතිබුණි.

(ii) සභා බලප්‍රදේශයේ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2013 ජනවාරි 02 දින රු.2,055,000 ක මුදලකට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර, මෙම පද්ධතිය ස්ථාපනය කර, 2013 ජූලි 02 දින හෝ ඊට පෙර මහා නගර සභාවට භාරදිය යුතුව තිබුණි. ගිවිසුම්ගත මුදලට අමතරව රු.2,026,950 ක් මේ වෙනුවෙන් වැයකර තිබුණු නමුත්, ව්‍යාපෘතිය ආරම්භ කර 2018 අගෝස්තු වනවිට වර්ෂ 05 ක් ගත වී තිබුණ ද, ව්‍යාපෘතිය අවසන් වී නොතිබුණි.

**(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-------------------------------------

මහා නගර සභා ආඥා පනතේ 247(ආ) වගන්තිය යටතේ සභා බලප්‍රදේශයේ පිහිටි කර්මාන්තවලින් සහ 247(ඇ) වගන්තිය යටතේ වෙළඳ ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් වාර්ෂික බදු මුදලක් අය කළයුතු අතර, ඒ පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් පවත්වා අදාළ ලේඛන යාවත්කාලීන කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ කටයුතු වර්ෂය අවසානය වනවිටත් නිමකර නොතිබුණි.

(ඈ) ගාල්ල මහා නගර සභා ක්‍රීඩා පිටිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දීමේ දී, 2008 අප්‍රේල් 20 දින සිට 2018 අප්‍රේල් 19 දිනෙන් අවසන් වන II වන කාලපරිච්ඡේදයට ගිවිසුම්ගත වීමක් සිදුව නොතිබුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සේවා නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**(ඊ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ රජ්ගම මොන්රෝවියා වත්ත කසළ අංගනය වෙත හා නොදිරන කසළ හීන්පැන්දල කසළ වත්තට බැහැර කරන නමුත්, 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 ගැසට් නිවේදනය හා 2017 මැයි මස පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන සැලැස්මක් නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ නාගරික ඉංජිනේරු අංශයේ නිවාඩු දින වැටුප් ගෙවීමේ දී පැමිණීම, පිටවීම ප්‍රමාණවත්ව සනාථ කිරීමෙන් තොරව හුදෙක් එක් එක් නිලධාරියාගේ ඇමතුම්

දිනපොතෙහි සඳහන් කාල වේලාවන් පදනම් කරගෙන නිලධාරීන් 06 දෙනෙකු සඳහා නිවාඩු දින වැටුප් ලෙස රු.443,471 ක් ගෙවා තිබුණි.

(ආ) සභාව සතුව JCB, ලෝඩර් සහ එක්ස්කැවේටර් යන්ත්‍ර 07 ක භාවිතය අවම මට්ටමක පැවතිය දී හීන්පැන්දල කසළ වත්තේ සේවයට 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභා අරමුදලින් රු.27,857,288 ක් වැයකර JCB යන්ත්‍රයක් සහ එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි.

(ඇ) මොහොදීන්වත්ත ප්‍රජා ශාලා ගොඩනැගිල්ල තුළ ස්ථාපිත, කායවර්ධන මධ්‍යස්ථානයට රු.1,325,630 ක් වටිනා කායවර්ධන උපකරණ ලබා දී තිබුණ ද, තොග ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. එහි භාරකරු වශයෙන් ගලි බවුසර් අධීක්ෂකට මසකට පැය 150 ක් වශයෙන් 2017 වර්ෂයට රු.148,222 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. කායවර්ධන මධ්‍යස්ථානයට පුහුණු උපදේශකවරයෙකුගේ සේවය ලබා ගෙන නොතිබූ අතර, මධ්‍යස්ථානය භාවිතා කරන්නන්ගේ ලියාපදිංචි නාම ලේඛනයක් නොතිබුණි. සාමාජිකයකුගෙන් එකතු කරනු ලබන රු.250 ක් වූ සාමාජික මුදල් ප්‍රජා සංවර්ධන සමිතියකට ලබා දී තිබූ අතර, ජල හා විදුලි බිල්පත් සභා අරමුදලින් දරා තිබුණි. කායවර්ධන මධ්‍යස්ථානයේ කටයුතු සම්බන්ධයෙන් ගිණුම් වාර්තා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් අතිරික්තව බඳවාගෙන තිබූ සේවකයින් 10 දෙනෙකු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, පුරප්පාඩු සේවකයින් 145 සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කළ නිලධාරීන් 26 දෙනෙකුට ලබාදුන් රු.1,191,804 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහා නගර සභාවේ ප්‍රජා සංවර්ධන ඒකකයට අදාළ වාර්ෂික කාර්යසාධන සැලැස්මක් නොතිබූ අතර, සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳ වාර්තාවන් පවත්වා ගැනීමක් හෝ හඳුනාගත් අඩුපාඩු, යෝජිත ක්‍රියාමාර්ග සහ ඒ වෙනුවෙන් ගත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කිසිවක් වාර්තාගතව නොතිබුණි.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 247(අ) වගන්තිය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපන ශාලා හා නවාතැන්පොලවල් වලින් සියයට 1 දක්වා බලපත්‍ර ගාස්තු අයකිරීමේදී අන්තර්ජාල තොරතුරු අනුව නාගරික බල ප්‍රදේශයේ සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් සංඛ්‍යාව 424 ක් බව හඳුනාගත හැකි වූ නමුත්, සභාව බලපත්‍ර ගාස්තු අයකිරීම ඒකක 14 කින් පමණක් සිදුකර තිබුණි. මහා නගර සභාව බලපත්‍ර ගාස්තු අය කරමින් තිබුණු හෝටල් 02 කින් අයවිය යුතුව පැවති රු.1,325,883 ක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම ඉකුත් වර්ෂ 08 කට අධික කාලයක් බලපත්‍ර ගාස්තුව, ලැබීම් වලින් සියයට 1 ක් ලෙස අයකර

තිබුණු අතර, 2017 වර්ෂයේ දී සියයට 0.5 ක් ලෙස අඩුකර නැවත 2018 වර්ෂයේ දී සියයට 1 ක් ලෙස ගැසට් කර තිබුණි.

(ඇ) සභා බලප්‍රදේශයේ වෙන්දේසි ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි ආදායමෙන් සියයට 1 ක ගාස්තු අයවීම් සහ වෙන්දේසි ඉඩම්වල භූමි ප්‍රමාණය මත පොදු පහසුකම් සැපයීමට සභාව වෙත පවරන සියයට 10 ක ඉඩම් කොටස ලැබීම, පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

**වාහන උපයෝජනය**

-----------------------

සභාව සතු වාහන 133 ක් සම්බන්ධව ඉන්ධන ලේඛන සහ ධාවන සටහන් පොත් ක්‍රමානුකූලව ගබඩා කර නොතිබුණි. සංචිත වාහන සඳහා අනුයුක්ත කර ඇති සියලුම රියදුරන් 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 වැනි වගන්තිය ප්‍රකාරව පොදු 268 හා 268(අ) දරන රියදුරු අත් පොතක් හා නිල වාහන සඳහා අනුයුක්ත කර ඇති රියදුරන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 ආකෘතියක් පවත්වාගෙන යා යුතු වුවත්, එවැනි ආකෘති කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 3.6 හඳුනාගත් පාඩු

-----------------

2012 මාර්තු 23 දින සිට 30 දින දක්වා ශ්‍රී ලංකා එංගලන්ත ක්‍රිකට් තරගාවලියේ විනෝද බදු ලෙස අයවිය යුතු මුදල වෙනුවෙන් පෙර තරගාවලිවලින් අලෙවි නොවූ ටිකට්පත් වෙනුවෙන් තැන්පත් කරන ලද එකතුව රු.5,585,673 ක් හිලව් කර තිබිය දී මෙම මුදල 2016 සැප්තැම්බර් 21 දින නැවත ක්‍රිකට් ආයතනයට ගෙවීම් කර තිබුණු අතර, එය මහා නගර සභා අරමුදලට සිදු වූ පාඩුවක් ලෙස හඳුනාගත හැකි විය.

## 3.7 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වැඩ, සේවා හා භාණ්ඩ හෝ ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

## 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් වල එකතුව රු.124,338,203 ක් වූ අතර, එම වටිනාකම් සියයට 22 සිට සියයට 80 අතර පරාසයක විය.

(ආ) වියදම් විෂයයන් 09 ක එකතුව රු.209,622,354 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම් සියයට 21 සිට සියයට 58 අතර පරාසයක පැවතුණි.

**4.2** **අභ්‍යන්තර විගණනය**

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරගත් අභ්‍යන්තර විගණන සැලැස්ම, පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නවලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

(ආ) අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ක්‍රියාකර මාසිකව, ත්‍රෛයි මාසිකව, අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. අර්ධ වාර්ෂිකව හා වාර්ෂික වාර්තා පමණක් කළමනාකරණය වෙත ඉදිරිපත් කර තිබූ නමුත්, එම වාර්තාවන්හි සඳහන් ඇතැම් නිරීක්ෂණයන් පිළිබඳව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3** **විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුව ඇතත්, සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබීම. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අතර පවතින ගිණුම් ශේෂවල වෙනස්කම් පැවතීම. |
| | | (iii) | ණයගැති, ණයහිමි ලේඛන හා කාල විශ්ලේෂණ නොතිබීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | (ii) | ලේඛනගත තොගය හා භෞතිකව පැවැති තොගය අතර පවතින වෙනස නිවැරදි නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | වාහන පාලනය | (i) වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම. |
| | | (ii) වාහන දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| | | (iii) අබලන් වූ වාහන ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) හිඟ ආදායම් අය කරගෙන නොතිබීම. |
| | | (ii) බිල්කල හැකි සියළුම ආදායම් සඳහා බිල්කර නොතිබීම. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු නොකිරීම |
| | | (ii) හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඊ) | අයවැය පාලනය | අයවැය පිළිබඳව පසු විපරම් කර, සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබීම. |